*සැ. යු.* - (i) 2018.07.13 දින පළ වූ අංක 2,080 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,081 - 2018 ජූලි මස 20 වැනි සිකුරාදා - 2018.07.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1122 | පළාත් පාලන සහා ඡන්ද ආඥානත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1127 | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* -(i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2018 ජූලි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජූලි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## අක්මීමන ප්‍රාදේශීය සභාව

01. දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර ව පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| 02. තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| ආදහනාගාර සහායක | 01 | PL1 - 2016<br>රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. |
| පුස්තකාල සහායක | 01 | PL1 - 2016<br>රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ. මෙම අය අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් දකුණු පළාත් බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතු ය.

(iv) අයදුම්කරුවන් මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(vi) අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සපුරා තිබිය යුතු ය.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(ii) අක්මීමන ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන්නේ වසර තුනක පරිවාස කාලයකට යටත්ව ය.

(iv) ඉහත සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අක්මීමන ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *බඳවා ගන්නා ක්‍රමය :* අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ ඇමුණුම් අංක 01 අනුව පහත සඳහන් පරිදි උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

| | *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02 | අමතර සුදුසුකම් (උපලේඛන 02ට අනුව අදාළ නම්) | 10 | |
| 03 | පළපුරුද්ද (උපලේඛන 02ට අනුව අදාළ නම්) | 10 | |
| 04 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන :*

01 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කෙරේ.
02. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

06. *අයදුම් කළයුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගන්නා අයදුම්පත් 2018.08.20 දිනට පෙර ලැබෙන සේ සභාපති, අක්මීමන ප්‍රාදේශීය සභාව, අක්මීමන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ඉල්ලුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතු ය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි ව අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපතක අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික/ශිෂ්‍ය කාර්ය දර්ශකය
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය (අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව මාස 06 ක් තුළ ලබා ගත් ග්‍රාම සේවා සහතිකය)
(iv) මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

08. මෙම අයදුම්පත කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල අක්මීමන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු ය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

2018 ක් වූ ජූනි මස 28 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සමරසේන කළුහෙවත්ත,
සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

## ආදර්ශ අයදුම්පත්‍රය

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවේ අදහනාගාර සහායක/පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත*

01. (i) මුලකුරු සමග නම :——————————.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.

04. ස්ථිර පදිංචි ලිපිනය :——————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

07. උපන් දිනය : වර්ෂය:———— මාසය :———— දිනය:————

08. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) : (සහතිකවල පිටපත් අමුණන්න.)
——————————————————————
——————————————————————.

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න.)
——————————————————————.

12. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්,
(i) තනතුර:——————————.
(ii) සේවය කරන ස්ථානය:——————————.
(iii) පත්වීම් දිනය:——————————.

13. ඔබ කවරදක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කරනු ලැබ තිබේද?
:——————————.

14. අයදුම්කරුගේ සහතිකය ඃ මෙම අයදුම්පතේ ම' විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැති ව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

15. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම් සතුටුදයක බවද, මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————

07-497

## හක්මන ප්‍රාදේශීය සභාව

හක්මන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති හක්මන ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| ආදාහනාගාර සහායක (ආදාහනාගාර ක්‍රියාකරු සහායක) | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය. |

*වැටුප් කේතය* : - PL 1 - 03/2016

*වැටුප් ක්‍රමය* :- රු. 24,250 - 10×250 - 10×270 - 10×300 - 12×330 - රු. 36,410 ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ.

02. *වයස් සීමාව* :

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ට වැඩි කාලයක් අයදුම්කරු හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

3.3 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

3.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

3.5 සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් තෝරා ගනු ලැබේ. (දැනට හක්මන ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ආදේශක/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

04. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි* :

4.1 මෙම තනතුර ස්ථිරය.

4.2 ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

4.3 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වේ. පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේනම් හා අනෙකුත් සේවයේ ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

4.4 මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝග වලටද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, දකුණු පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා හක්මන ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට සියළු සේවකයන් බැඳී සිටිය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය :*

6.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2018.08.13 දිනට පෙර "ලේකම්, හක්මන ප්‍රාදේශීය සභාව, හක්මන." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

6.2 අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය. ("..................... තනතුර සඳහා අයදුම්පත")

6.3 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

6.4 අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.5 අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය.
(ii) අධ්‍යාපන සහතිකය.
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය.
(iv) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්.
(vi) වසර 03 ට වැඩි පලපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

07. අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේදී හෝ/හා බඳවා ගැනීම ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය වෙනස් කිරීම සංශෝධනය කිරීමේ බලය හක්මන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

වී. පී. කේ. අනුරාධ ප්‍රේමරත්න,
සභාපති,
හක්මන ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 02 වැනි දින,
හක්මන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ආදර්ශ අයදුම්පත

**හක්මන ප්‍රාදේශීය සභාව**

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :————————————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————————.

03. ස්ථිර ලිපිනය :————————————.

04. උපන් දිනය :————————————

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු :————. මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :————————————

07. විවාහක/ අවිවාහක බව :————————————

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? :————————————

09. අධ්‍යාපන සුදුසුකම් :————————————

10. සේවා පලපුරුද්ද :————————————

11. වෙනත් සුදුසුකම් :————————————

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියෙන් වරදකරු වී තිබේද? :————————————

13. ඔබ දැනට මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————————————

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව ට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හා පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

___________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

........................................................................................ මයා/මිය./මෙනවිය මෙම ආයතනයේ/කාර්යාලයේ .............................................ලෙස සේවය කරන බවත්, ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, සහතික කරමි.

___________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————.

07-718

---

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු පිරවීම**

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය කම්කරු III පන්තිය සහ මුරකරු III පන්තිය යන තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් 2018.06.29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ අතර එම තනතුරු සඳහා අයදුම් කළයුතු අවසාන දිනය ලෙස 2018.06.30 ලෙස සඳහන් වුවත් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2018.08.05 වැනි දින දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

යූ. ජී. ජයරත්න,
ලේකම්,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුඳුවත්ත කඩවීදිය,

2018 ජූලි මස 04 වැනි දින.

07-634

---

# පළාත් පාලන නිවේදන

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය ප්‍රකාරව හා 1975 අංක 04 දරන වීථි නම් කිරීම සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීම පනතේ අංක 57 (අ) වගන්තිය ප්‍රකාරව වීථියක් නම් කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය ප්‍රකාරව හා 1975 අංක 04 දරන වීථි නම්කිරීම සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීම පනතේ අංක 57 (අ) වගන්තිය ප්‍රකාරව සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොළඹ-නුවර පාර හා නුංගමුව රබර් කර්මාන්ත ශාලාවට යාබද භාවනා මධ්‍යස්ථානය අසල පිහිටි මාර්ගය "ජය මාවත" නමින් නම් කිරීම සඳහා සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව මෙයින් නිවේදනය කරමි.

චන්දන කුමාර ජයවන්දල,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මාවනැල්ල.

2018 ක් වූ ජුනි මස 14 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-632

## තවලම ප්‍රාදේශීය සභාව

ගැසට් අංක 1864 - 2014 මැයි මස 23 වැනි දින *ගැසට් පත්‍රයේ* පි. අ. 710 හි සඳහන් දාම්මල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පහල කොණ්ඩගුලන කන්ද පාර, එම මාර්ගයේ ආරම්භය වන දාම්මල කොළනිය ප්‍රධාන පාරත්, එම මාර්ගයේ අවසානය වන කොණ්ඩගුලන පාරත් වන අතර, එහි පළල මීටර් 3.65 ක් හා දිග කි. මී. 2.35 ක් ලෙසින් ගැසට් කර ඇත.

එම මාර්ගය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය සභාවේ 2018.05.22 දින පැවති මාසික සභා රැස්වීමේ දී සම්මත කර ගන්නා ලද යෝජනාව මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණ සම්බන්ධයෙන් ඉඩම් හිමියන්ගේ, ප්‍රදේශවාසීන්ගේ විරෝධතා ඇත්නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වී දින 14 ක් තුළ දී හේතු ඇතුළත්ව පිටපත් දෙකකින් මා වෙත ඉදිරිපත් කල යුතු වේ. මෙකී කාලය තුල විරෝධතාවයක් නොමැති වුවහොත් ඉන්පසු එම මාර්ගය 2018. 05. 22 දින සිට පූජ්‍ය දාම්මල සුජාත හිමි මාවත ලෙස නම් කරනු ලබන බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය සභාවේ 2018.05.22 දින පැවති මහ සභාවේ, දාම්මල ජනපද ප්‍රවේශ මාර්ගය, ලිපියෙන් ඉල්ලා ඇති පරිදි පූජ්‍ය දාම්මල සුජාත හිමි මාවත නමින් නම් කිරීමට ගරු මන්ත්‍රී චින්තක තුඩුවගේ මැතිතුමා කළ යෝජනාව ගරු මන්ත්‍රී එල්. එන්. ප්‍රදීප් පුෂ්පකුමාර මැතිතුමා ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

| *මාර්ගයේ නම* | *ග්‍රාමසේවා වසම* | *ආරම්භය* | *අවසානය* | *පළල(m)* | *දිග (m)* |
|---|---|---|---|---|---|
| පූජ්‍ය දාම්මල සුජාත හිමි මාවත | දාම්මල ජනපදය | දාම්මල කොලණිය ප්‍රධාන පාර | කොණ්ඩගුලන | 3.65 | 2.35 |

07 - 478

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.